# ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

**විගණන විමසුම - AUDIT QUERY - கணக்காய்வு விசாரணை**

| | | | |
|---|---|---|---|
| විමසීම් අංකය<br>விசாரணை இலக்கம்<br>Query No | SGLG/KG/A/WPS/2023/AQ/40 | නිකුත් කරන දිනය<br>வழங்கிய திகதி<br>Date of issue | 2024 මැයි 17 දින |
| Addressed to | ලේකම් හා බලතල, කාර්ය කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරි, ප්‍රාදේශීය සභාව அவர்களுக்கு<br>වරකාපොල. | | |
| විෂයය<br>விடயம்<br>Subject | මූල්‍ය ප්‍රකාශන විගණනය - 2023 – වරකාපොල ප්‍රාදේශීය සභාව | | |

**මෙය පැහැදිලි කිරීම සඳහා තොරතුරු කැඳවීමක්/විමසීමක් වන අතර විගණන වාර්තාවක් නොවේ.**
This is only a query calling for information for clarification and not an audit report.
**இவ்விசாரணை தகவல்களைப் பெற்றுக் கொள்ளவும், பகுப்பாய்வதற்காகவுமே அன்றி இது ஒரு கணக்காய்வு அறிக்கை அல்ல.**

2023 අවසන් ගිණුමට අදාළව සිදුකරන ලද විගණනයේදී පහත කරුණු නිරීක්ෂණය විය.

02. ගිණුම්කරණ අඩුපාඩු

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2023 වර්ෂයට අදාළ රු.26,640 ක වියදම් සඳහා ණයහිමි වෙන්කිරීම් කර නොමැති නිසා එම ප්‍රමාණයෙන් වර්ෂයේ වියදම් හා ණයහිමියන් අඩුවෙන් දක්වා තිබුණි. විස්තර පහත දැක්වේ.

| ගෙවූ දිනය හා වවුචර් අංකය | විස්තරය | වටිනාකම රු. |
|---|---|---|
| 166<br>2024.01.29 | 2023.12.28 කුමාර ගොඩනැගිලි ද්‍රව්‍ය සැපයුම්කරුවෝ | 23,000 |
| 156<br>2024.01.22 | 2023.12.27 වියදුරු විවේකාගාරය සඳහා පානීය ජල බෝතල් රදවනයක් මිලදී ගැනීම | 1,800 |
| 155<br>2024.01.22 | 2023.12.22 අත්සන් ලේඛනයක් මිලදී ගැනීම | 1,840 |
| | | 26,640 |



අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை
No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94 11 2 88 70 28 - 34
+94 11 2 88 72 23
ag@auditorgeneral.gov.lk
www.naosl.gov.lk

(ආ) රු.4,000 ක් වටිනාකමැති පුස්තකාල තැන්පත් 02 ක් මිශ්‍ර තැන්පත් වලින් අත්හැරී තිබීම හේතුවෙන් පොදු තැන්පත් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. විස්තර පහත දැක්වේ.

| දිනය | විස්තරය | වටිනාකම රු. |
|---|---|---|
| 2022.08.22 | මායින්නොළුව මහජන පුස්තකාලය (ලි.ප.අ.-70953) | 2,000 |
| 2022.08.27 | මායින්නොළුව මහජන පුස්තකාලය (ලි.ප.අ.-70783) | 2,000 |
| | | 4,000 |

(ඇ) කෝන්ගහඕවිට නැමති කුඹුර ලෙස හඳුන්වනු ලැබූ වරකාපොල ප්‍රාදේශීය සභාව පිහිටි ඉඩම හා ගොඩනැගිල්ල රජයේ තක්සේරු දෙපාර්තමේන්තුවේ නව තක්සේරු වටිනාකමට ගිණුම්ගත කර තිබූ අතර පැරණි වටිනාකම වූ රු.100,000 ක් ඉවත්කර නොතිබීම හේතුවෙන් ස්ථාවර වත්කම් එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඈ) කාර්යාල ගොඩනැගිල්ලේ පඩිපෙලෙහි ගේට්ටුව සකස් කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේදී වැය වූ රු.245,550 ප්‍රාග්ධනිත කර නොතිබීම හේතුවෙන් ස්ථාවර වත්කම් එම ප්‍රමාණයයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඉතිරි ශේෂය වූ රු.30,000 ක වටිනාකමැති මළ සිරුරු බහාලුම් 06 ක් ඉතිරි තොගයෙන් අතහැරී තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේදී ඉඩම් කට්ටි කිරීම් වෙනුවෙන් ලද 1 % ක ආදායම් රු.615,482 ක් පොදු තැන්පත් ලෙස රඳවාගෙන තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ආදායම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(උ) පෙර වර්ෂයට හා සමාලෝචිත වර්ෂයට අදාළව ලැබී තිබුණු විනෝද බදු ආදායම් පිළිවෙලින් රු.20,000 ක් හා 352,500 ක් වශයෙන් එකතුව රු.372,500 ක් පොදු තැන්පතු ලෙස රඳවාගෙන තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ විනෝද බදු ආදායම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

03. නොසැසඳුනු පාලන ගිණුම්

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ගිණුම් විෂයයන් 04 ක මූල්‍ය ප්‍රකාශන අනුව හා උපලේඛන අනුව ශේෂ අතර රු.9,605,066ක වෙනසක් නිරීක්ෂණය විය.

| විස්තරය | මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂය රු. | උපලේඛන අනුව ශේෂය රු. | වෙනස රු. |
|---|---|---|---|
| යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 26,316,881 | 25,947,578 | 369,303 |
| විවිධ තැන්පතු | 6,520,259 | 2,173,878 | 4,346,381 |
| ටෙන්ඩර් ඇප තැන්පත් ගිණුම | 5,188,857 | 303,930 | 4,884,927 |
| දේශිය ණය හා සංවර්ධන අරමුදල | 11,936,462 | 11,932,007 | 4,455 |
| | 49,962,459 | 40,357,393 | 9,605,066 |

(ආ) මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂ හා භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂ 04 ක රු.708,944 ක නොසැසඳීමක් නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

| විස්තරය | මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂය රු. | උපලේඛන අනුව ශේෂය රු. | වෙනස රු. |
|---|---|---|---|
| වරකාපොල මහජන පුස්තකාලය | 2,790,196 | 3,036,853 | 246,657 |
| මායින්නොළුව මහජන පුස්තකාලය | 1,409,985 | 1,563,390 | 153,405 |
| අල්ගම මහජන පුස්තකාලය | 1,775,768 | 1,911,419 | 135,651 |
| දැදිගම මහජන පුස්තකාලය | 2,137,950 | 2,311,181 | 173,231 |
| | 8,113,899 | 8,822,843 | 708,944 |

(ඇ) තැම්පත් ලේඛනය හා උපලේඛන අතර රු.27,587 ක නොසැසඳීමක් නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

| විස්තරය | මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂය රු. | උපලේඛන අනුව ශේෂය රු. | වෙනස රු. |
|---|---|---|---|
| **මිශ්‍ර තැන්පත්** | | | |
| එම්.රිස්වාන් (68106) | - | 4,950 | 4,950 |
| **වෙන්ඩර් තැන්පත්** | | | |
| කේ.ඒ.ගාමිණී ප්‍රේමලාල් (57659) | - | 250 | 250 |
| කේ සිරිවර්ධන (21826) | 200 | 260 | 60 |
| **ගිවිසුම් ඇප** | | | |
| කේ.ඒ.ශ්‍රියාණි මංගලිකා (18489) | - | 2,827 | 2,827 |
| ඩී.එච්.ආනන්ද කරුණාරත්න (18497) | - | 19,500 | 19,500 |
| | 200 | 27,787 | 27,587 |

## 04. විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

සමාලෝචිත වර්ෂය අවසානයට එකතුව රු. 172,388,657 ක් වූ ගිණුම් විෂයයන් 07ක් සඳහා ලේඛන, උපලේඛන ඉදිරිපත් කර නොතිබීම හේතුවෙන් විගණනයේදී සත්‍යාපනය කළ නොහැකි විය. විස්තර පහත දැක්වේ.

| ගිණුම | වටිනාකම රු. | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|
| ඉඩම් ගොඩනැගිලි | 125,171,911 | ස්ථාවර වත්කම් ලේඛන |
| වාහන | 44,505,720 | ස්ථාවර වත්කම් ලේඛන |
| පුස්තකාල ඇප තැන්පත් | 77,756 | |
| ආදායම් වෙනුවෙන් තැන්පත් | 2,093,029 | (i) තැන්පත් ලේඛන |
| පාරිභෝගික ඇප තැන්පත් | 493,087 | (ii) උපලේඛන |
| පළාත් පාලන සහකාර කොමසාරිස් | 7,784 | |
| පළාත් සභා කර්මාන්ත | 39,370 | |
| එකතුව | 172,388,657 | |

05. අනුකූල නොවීම

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) මුදල් රෙගුලාසි 371 ප්‍රකාරව අතුරු අග්‍රිම දෙසැම්බර් 31 දිනට පියවිය යුතු වුවත් රු.469,631 ක් වටිනාකමැති අග්‍රිම 19 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් පියවා නොතිබුණි. ඒ තුළ 2021 හා 2022 වර්ෂ වලට අදාළ නොපියවා තිබූ රු.72,845 ක් වටිනාකමැති අග්‍රිම 03 ක්ද විය.

(ආ) මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කල් ඉකුත්වූ තැන්පතු ආදායමට ගැනීමට කටයුතු කළ යුතු වුවත් රු.1,610,445 වටිනාකමැති තැන්පතු 149 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. විස්තර පහත දැක්වේ.

| වර්ෂය හා විස්තරය | ප්‍රමාණය | වටිනාකම රු. |
|---|---|---|
| මිශ්‍ර තැන්පත් | | |
| 2008 | 02 | 81,974 |

58

| | | |
|---|---|---|
| 2009 | 02 | 3,371 |
| 2010 | 02 | 474 |
| 2011 | 03 | 3,597 |
| 2012 | 01 | 4,815 |
| 2013 | 01 | 400 |
| 2014 | 06 | 217,059 |
| 2015 | 02 | 72,190 |
| 2016 | 08 | 140,244 |
| 2017 | 05 | 21,224 |
| 2018 | 06 | 133,068 |
| 2019 | 02 | 6,000 |
| 2020 | 29 | 218,430 |
| 2021 | 31 | 200,250 |

ටෙන්ඩර් තැන්පත්

---------------------

| | | |
|---|---|---|
| 2011 | 01 | 7,500 |
| 2012 | 01 | 7,500 |
| 2014 | 01 | 1,000 |
| 2019 | 01 | 250 |
| 2020 | 01 | 250 |
| 2021 | 15 | 71,000 |

ගිවිසුම් ඇප

-------------

| | | |
|---|---|---|
| 2006 | 01 | 207,000 |
| 2008 | 06 | 36,806 |
| 2011 | 04 | 28,445 |
| 2012 | 02 | 19,878 |
| 2013 | 07 | 42,537 |
| 2014 | 04 | 34,272 |

ගිවිසුම් ඇප

| | | |
|---|---|---|
| 2015 | 01 | 7,038 |
| 2020 | 01 | 2,248 |
| 2021 | 03 | 41,625 |
| | 149 | 1,610,445 |

(ඇ) පළාත් පාලන ප්‍රතිසංස්කරණ චක්‍රලේඛ සංග්‍රහයේ අංක 03/2010 දරණ චක්‍රලේඛයේ 13 ඡේදයේ පරිදි සෞඛ්‍යයට අහිතකර ගොඩනැගිලි ඉදිකිරීම් පාලනය කිරීම / විධිමත් කිරීම, අනවසර ඉදිකිරීම් වැළැක්වාලීම නොකරනු ලබන අයට එරෙහිව නීතිමය පියවර ගැනීමටත් කටයුතු කළ යුතු බව දක්වා ඇතත්, අනවසර ඉදිකිරීම් 09 ක් සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබුණි.

(ඈ) නිකුත් කළ නමුත් මාරු නොවූ රු.2,000 ක වටිනාකමැති 2023 ජුනි 08 දින නිකුත් කරන ලද චෙක්පතක් සම්බන්ධවෙන් මුදල් රෙගුලාසි 396 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ඉ) නාගරික සංවර්ධන අධිකාරිය විසින් 1987 සැප්තැම්බර් 30 දිනැති අංක 05/01/119 යටතේ නිකුත් කරනු ලැබූ සැලසුම් චක්‍රලේඛ අංක 08 හා 1993 මාර්තු 16 දිනැති අංක 05/01/150 යටතේ නිකුත් කරනු ලැබූ සැලසුම් චක්‍රලේඛ අංක 14 ප්‍රකාරව පළාත් පාලන ආයතනය සහ නාගරික සංවර්ධන අධිකාරිය නමින් ඒකාබද්ධ බැංකු ගිණුමක් විවෘත කළ යුතු වුවත් එසේ කටයුතු කර නොමැති වීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අවස්ථා 02 කදී පොදු රථ ගාලක් ඉදිකිරීම සඳහා අය කරන ලද සේවා ගාස්තු රු.500,000 ක් පොදු තැන්පත් යටතේ රඳවාගෙන තිබිණි.

## 06. ආදායම් රැස් කිරීමේ කාර්ය සාධනය

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තු ගත ආදායම්, රැස්කළ ආදායම සමඟ සැසඳීමේදී වරිපනම් හා බදු, කුලී, බලපත්‍ර ගාස්තු, වෙනත් ආදායම් යන ආදායම් විෂයන්ගේ රැස්කළ

ආදායම ඇස්තමේන්තු ගත ප්‍රමාණයට වඩා පිළිවෙලින් සියයට 21.09 කින්, 33.33 කින්, 61.20 කින්, හා 29.07 කින් අඩු වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| | ආදායම් වර්ගය | ඇස්තමේන්තු ගත ආදායම | රැස්කළ ආදායම | වෙනස | ප්‍රතිශතය |
|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | % |
| 01. | වරිපනම් හා බදු | 7,984,000 | 6,299,993 | 1,684,007 | 21.09 |
| 02. | කුලී | 20,896,515 | 13,931,276 | 6,965,239 | 33.33 |
| 03. | බලපත්‍ර ගාස්තු | 3,396,000 | 1,317,387 | 2,078,613 | 61.20 |
| 04. | වෙනත් ආදායම් | 15,299,180 | 10,851,326 | 4,447,854 | 29.07 |
| | | 47,575,695 | 32,399,982 | 15,175,713 | |

(ආ) වරිපනම් හා බදු

I. වරිපනම්

මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය අවසානයට හිඟහිටි වරිපනම් ශේෂය රු.4,954,304 ක්වූ අතර, ඒ තුළ වසර 01 ත් 05 ත් අතර රු.1,716,011 ක ශේෂයක්ද වසර 05 වැඩි රු.325,494 ක ශේෂද විය.

II. අක්කර බදු

මූල්‍ය ප්‍රකාශන සමාලෝචිත වර්ෂය අවසානයට හිඟහිටි අක්කර බදු ශේෂය රු.182,815 ක්වූ අතර, ඒ තුළ වසර 01 ත් 05 ත් අතර රු.27,613 ක ශේෂයක්ද වසර 05 වැඩි රු.146,879 ක ශේෂද පැවතුණි.

07. මානව සම්පත් කළමනාකරණය

-----------------------------------

සේවක ණය

--------------

2023 දෙසැම්බර් 31 දිනට මියගිය, ස්ථාන මාරුවී ගිය, සේවය අතහැර ගිය නිලධාරීන් දෙදෙනෙකුගේ අයවිය යුතු ණය ශේෂය රු.105,305 ක් වන අතර, වසර 02 සිට වසර 13 දක්වා කාලයක් ගතවී තිබුණද ඒවා අයවී නොතිබුණි.

08. ලැබිය යුතු ගිණුම්

----------------------

සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශන අනුව රු.8,968,875 ක්වූ ණයගැති ශේෂය තුළ වසර 01 ත් වසර 05 ත් අතර රු.1,266,300 ක ශේෂද වසර 05 ට වැඩි රු.1,011,285 ක ශේෂද විය.

09. කළමනාකරණ අකාර්යක්ෂමතා

-----------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ජල සම්පාදන අමාත්‍යාංශයේ කෑගල්ල දිස්ත්‍රික්ක ව්‍යාපෘති කාර්යාලය විසින් 2022 ඔක්තෝබර් 19 දින පරිත්‍යාග වශයෙන් ලබාදී තිබුණු ජල මීටර් 50 ක වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබෙන සියළුම මුදල් බැංකුගත කිරීමට කටයුතු නොකර එක් බැංකු ගිණුමකට අදාළව රු.427,045 ක් වටිනාකමැති අතැති මුදල් ශේෂයක් රඳවාගෙන තිබුණි.

54

10. වත්කම් කළමනාකරණය

---

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් ප්‍රාදේශීය සභාව සතු අංක RA-4129 ට්‍රැක්ටරය 2017 වර්ෂයේ සිට ධාවනයෙන් ඉවත්කර තිබුණද වසර 06 කට අධික කාලයක් තිස්සේ අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) වත්කම් තක්සේරු කිරීම

2017 අගෝස්තු 16 දිනැති අංක 04/2017 දරන සබරගමුව පළාත් භාණ්ඩාගාර චක්‍රලේඛයේ 3.1 ඡේදය අනුව ඉඩම් හා ගොඩනැගිලි තක්සේරු දෙපාර්තමේන්තුව මගින් තක්සේරු කරවාගත යුතු බවත් එම තක්සේරු වාර්තා ලැබෙන තෙක් තාවකාලික පියවරක් වශයෙන් එම වත්කම් පිළිබඳ තාක්ෂණික දැනුම ඇති නිලධාරියෙකු සහිත ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා විසින් පත්කරන කමිටුවක් මගින් තක්සේරු කරවා ගතහැකි බව සඳහන් කර තිබියදී, ඊට පටහැනිව ලේකම්, සැලසුම් ශිල්පී හා ආදායම් පරීක්ෂකගෙන් සැදුම්ලත් කමිටුවක් මගින් සිදුකරන ලද තක්සේරුව පදනම් කරගෙන ඉඩම් ගොඩනැගිලි 209 ක් සඳහා රු.125,171,911 ක වටිනාකමක් ගිණුම්ගත කර තිබුණි.

11. ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

---

(අ) ඉදිරිපත් කර තිබූ ධාවන සටහන් හා ගමන් වියදම් ඉල්ලුම් පත්‍ර ප්‍රකාරව කුමන වුවමනාවකට ගමන් ගියේද යන්න නිසි පරිදි සනාථ කර ගැනීමකින් තොරව හිටපු සභාපතිවරයාට සහ රියදුරු දෙදෙනෙකුට 2018 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා රු.723,200 ක ගමන් වියදම් ගෙවා තිබුණි.

(ආ) 2020 ජනවාරි සිට 2023 මාර්තු කාල සීමාව තුළදී හිටපු සභාපතිවරයා සහභාගී වූ කමිටු රැස්වීම් දින 37 කදී හිටපු සභාපතිවරයාගේ කැබ් රථය කිලෝමීටර් 4,300 ක් ධාවනය කිරීම වෙනුවෙන් රු.66,132 ක වටිනාකමැති ඉන්ධන සභා අරමුදලින් ලබාගෙන ඇති බව නිරීක්ෂණය විය. (කමිටු රැස්වීම දින 37 දීම සම්පූර්ණ රාජකාරි කාලයම එනම් පෙ.ව.7.00 සිට ප.ව.7.15 දක්වාම කාර්යාලයෙන් බැහැරව සිටි බව ධාවන සටහන් වල දක්වා තිබුණි.)

12. කොන්ත්‍රාත් පරිපාලනය

---------------------------

(අ) වරකාපොල නව නගර ශාලා සංකීර්ණයක් ඉදිකිරීමේ යෝජනාව අනුව පැරණි නගර ශාලා ගොඩනැගිල්ල හා පුස්තකාල ගොඩනැගිල්ල කඩා ඉවත් කිරීම සඳහා සබරගමුව ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලැබී තිබුණේ 2021 අගෝස්තු 30 දින වුවත් එම අනුමැතිය ලැබීමට පෙර එනම්, 2021 අගෝස්තු 11 දින පැරණි නගර ශාලා ගොඩනැගිල්ල කඩා ඉවත් කිරීමට මිල ගණන් කැඳවා තිබුණි.

(ආ) ප්‍රාදේශීය සභා යටිතල පහසුකම් සංවර්ධනය කිරීම 2021 යටතේ නගර ශාලා ගොඩනැගිල්ල අළුතින් ඉදිකිරීම පළමු අදියර ව්‍යාපෘතිය සඳහා රු.56,100,165 ක කොන්ත්‍රාත් වටිනාකමකට 2021 අගෝස්තු 12 දින , දින 270 කට ගිවිසුම් ගතවී වැඩ ආරම්භ කර තිබුණි. නමුත් 2022 දෙසැම්බර් 02 දින දෙපාර්ශවයේම එකඟතාවය මත මෙම ව්‍යාපෘතිය රු.23,811,882 ක නිමි වැඩ වටිනාකමක් සහිතව වැඩ අවසන් කර තිබුණි. නමුත්, ප්‍රයෝජනයට ගත හැකි පරිදි වැඩ අවසන් කර නොමැති වීම හේතුවෙන් 2024 අප්‍රේල් 25 විගණිත දින වන විටත් එම ගොඩනැගිල්ල නිෂ්කාර්යව පවතින බව නිරීක්ෂණය විය.

13. ගිණුම් කටයුතු සහ යහපාලනය

---------------------------------

අයවැය පාලනය

------------------

පහත කරුණු හේතුවෙන් වාර්ෂික අයවැය මූල්‍ය පාලනය කාර්යයක් ලෙස යොදා ගැනීමට සභාව අපොහොසත් වී තිබුණි.

(අ) සමාලෝචිත වර්ෂයේ වැය විෂයයන් 67 කට අදාළව එකතුව රු. 173,959,428 ක්වූ මුළු ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි. තොරතුරු ඇමුණුම 01 හි දැක්වේ.

(ආ) සමාලෝචිත වර්ෂයේ වැය විෂයයන් 80 කට අදාළව එකතුව රු. 65,821,174 ක්වූ මුළු ප්‍රතිපාදනයෙන් සියයට 11.63 සිට සියයට 99.94 දක්වා පරාසයක ඉතිරි වීම් පැවතුණි. තොරතුරු ඇමුණුම 02 හි දැක්වේ.

උක්ත කරුණු සම්බන්ධයෙන් ඔබගේ අදහස් හා ගනු ලබන ක්‍රියාමාර්ග දින 14 ක් ඇතුළත විගණනය වෙත දන්වන්නේ නම් මැනවි.

<u>පිළිතුරු එවිය යුතු ලිපිනය</u>

විගණන අධිකාරී,

විගණන උප කාර්යාලය,

කලාප අධ්‍යාපන කාර්යාලය,

කෑගල්ල.

එම්. එන්. විජේසූරිය
විගණන අධිකාරී

එම්.එන්. විජේසූරිය,

විගණන අධිකාරී ( එස්පීඑල්ජී/කේජී/ඒ),

ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති වෙනුවට.

පිටපත :- පළාත් පාලන කොමසාරිස්, සබරගමුව පළාත් සභාව, රත්නපුර.

ජේදයට යොමුව :- 13 (අ) ඇමුණුම 01

මූළ ප්‍රතිපාදනයම ඉතිරිවීම

| අනු අංක | වැය විෂය අංකය | වැය විෂය විස්තරය | වටිනාකම රු. |
|---|---|---|---|
| 1 | 102(2) | ගමන් වියදම් (ස්ථාන මාරු) | 1,000.00 |
| 2 | 102(3) | ගමන් වියදම් (විදේශීය) | 300,000.00 |
| 3 | 102(9) | ගමන් වියදම් (වෙනත්) | 5,000.00 |
| 4 | 105(4) | වරිපනම් බදු වට්ටම් | 300,000.00 |
| 5 | 105(6) | වත්කම් නිරවුල් කිරීමට | 50,000.00 |
| 6 | 109(1) | කාර්යාල උපකරණ | 1,000,000.00 |
| 7 | 109(4) | කාර්යාලය සඳහා වැසිකිලියක් සෑදීම | 500,000.00 |
| 8 | 109(6) | කාර්යාලය සඳහා ජෙනරේටර 2ක් මිලදී ගැනීම | 7,500,000.00 |
| 9 | 109(9) | සභා ගර්භයේ ශබ්ද විකාශන පද්ධතිය නවීකරණය | 500,000.00 |
| 10 | 109(10) | සභා ගර්භය නවීකරණය | 500,000.00 |
| 11 | 109(11) | වාහන නඩත්තු ඒකකයක් සැකසීම (සේවා ස්ථානයක්) | 1,000,000.00 |
| 12 | 202(2) | ගමන් වියදම් (වෙනත්) | 5,000.00 |
| 13 | 203(3) | කාර්මික හා විදුලි උපකරණ | 20,000.00 |
| 14 | 203(9)1 | මෘතදේහ බහාලුම් සකස් කිරීම (මිනී පෙට්ටි) | 50,000.00 |
| 15 | 205(9)2 | පරිසර පරීක්ෂක සේවා ගාස්තු | 5,000.00 |
| 16 | 205(9)3 | පරිසර වැඩසටහන් | 600,000.00 |
| 17 | 205(9)4 | කොම්පෝස්ට් බඳුන් ලබා ගැනීම | 200,000.00 |
| 18 | 205(9)5 | සුසාණ භූමි මිනුම් කිරීම | 300,000.00 |
| 19 | 205(9)6 | කොම්පෝස්ට් ඒකකයක් පිහිටුවීමට පුහුණුවක් ලබා දීම | 100,000.00 |
| 20 | 207(2) | සුභ සාධක සේවා පහසුකම් | 50,000.00 |
| 21 | 207(3) | ළමා හා මාතෘ සායන නැංවීම | 200,000.00 |
| 22 | 207(4) | වසංගත හා බෝවන රෝග මර්ධනය | 500,000.00 |
| 23 | 207(8) | කාණු පද්ධතිය පිරිසිදු කිරීම (තෙළුන්දෙනිය/ වරකාපොල/ අඹේපුස්ස /වාරියගොඩ) | 50,000.00 |
| 24 | 209(1) | ප්‍රාග්ධන උපකරණ | 50,000.00 |
| 25 | 209(7)3 | තෙලිඇල්ල කසල වැඩබිම නඩත්තුව හා ඒ ආශ්‍රිත වන වගාව | 50,000.00 |

(51

| | | | |
|---|---|---|---|
| 26 | 209(12) | අල්ගම නගරයට පොදු වැසිකිලියක් ඉදිකිරීම | 1,200,000.00 |
| 27 | 303(1) | ලිපි ද්‍රව්‍ය හා කාර්යාල උපකරණ | 1,000.00 |
| 28 | 303(4) | තැනීම් ද්‍රව්‍ය (ප්‍රිමික්ස් ව්‍යාපෘතියට) | 100,000.00 |
| 29 | 303(9) | වෙනත් ගබඩා භාණ්ඩ | 5,000.00 |
| 30 | 303(9)1 | වෙල්ඩින් වැඩපල සඳහා අවශ්‍ය උපකරණ | 50,000.00 |
| 31 | 304(4) | මංමාවත් හා කාණු අළුත්වැඩියාව හා නඩත්තුව | 20,000.00 |
| 32 | 309(4) | බෝක්කු බට මිලදී ගැනීම | 1,000,000.00 |
| 33 | 309(9) | ක්‍රීඩා පිටි සැකසීම හා සංවර්ධනය | 500,000.00 |
| 34 | 309(10) | මාර්ග හා ගොනැගිලි නඩත්තු ඒකකයක් සැකසීම | 100,000.00 |
| 35 | 404(1) | වාහන යන්ත්‍ර සූත්‍ර හා උපකරණ අළුත්වැඩියාව හා නඩත්තුව | 250,000.00 |
| 36 | 409(2) | මාහේන ජල යෝජනා ක්‍රමයට මුර කුටියක් සැදීම | 800,000.00 |
| 37 | 502(1) | ගමන් වියදම් (දේශීය) | 2,000.00 |
| 38 | 503(7) | නිල ඇඳුම් | 4,000.00 |
| 39 | 504(9) | වෙනත් නඩත්තු වැඩ | 50,000.00 |
| 40 | 505(2)1 | සම්බන්ධතා වැය - දූරකථන බිල්පත් | 50,000.00 |
| 41 | 505(4) | වෙනත් | 100,000.00 |
| 42 | 509(1) | ප්‍රාග්ධන උපකරණ | 50,000.00 |
| 43 | 509(2) | පොදු ලිං ඉදි කිරීම හා නඩත්තුව | 1,000,000.00 |
| 44 | 509(3) | සතිපොල සංවර්ධනය | 2,000,000.00 |
| 45 | 509(6) | වාරියගොඩ නගරයේ රථවාහන නැවතුම්පලක් සැකසීම | 500,000.00 |
| 46 | 509(7) | පැරණි කාර්යාල භූමියේ සාප්පු සංකීර්ණයක් ඉදි කිරීම (කී මනි) | 80,000,000.00 |
| 47 | 509(8) | පැරණි කාර්යාල භූමියේ සාප්පු සංකීර්ණයක් ඉදි කිරීම (දේශීය ණය සංවර්ධන අරමුදල ණය 80%) | 16,000,000.00 |
| 48 | 509(10) | පැරණි කාර්යාල භූමියේ සාප්පු සංකීර්ණයක් ඉදි කිරීම (සභා දායකත්වය) | 4,000,000.00 |
| 49 | 509(11) | පැරණි කාර්යාල භූමියේ සාප්පු සංකීර්ණයක් ඉදි කිරීම (ණය ආපසු ගෙවීම) | 2,427,428.34 |
| 50 | 509(12) | වරකාපොල හෙළ බොජුන් හල සඳහා ළිඳක් සකස් කිරීම | 800,000.00 |
| 51 | 603(7) | නිල ඇඳුම් | 4,000.00 |
| 52 | 603(8) | වෙනත් ගබඩා භාණ්ඩ | 10,000.00 |
| 53 | 604(1) | වාහන යන්ත්‍ර සූත්‍ර හා උපකරණ අළුත්වැඩියාව | 50,000.00 |
| 54 | 607(2) | සහනාධාර - නිවාස ආධාර | 1,200,000.00 |

| | | | |
|---|---|---|---|
| 55 | 607(9)3 | පලාත් පාලන මාසය | 300,000.00 |
| 56 | 607(9)4 | සාහිත්‍ය උත්සවය | 700,000.00 |
| 57 | 607(9)5 | උත්සව වෙනත් | 400,000.00 |
| 58 | 607(9)6i | ප්‍රජා සංවර්ධන වැඩසටහන් (කාන්තාවන් ස්වයං රැකියා සඳහා පුහුණු කිරීම හා ඒ ආශ්‍රිත උපකරණ ලබා දීම) | 1,000,000.00 |
| 59 | 607(9)9 | අඩු ආදායම්ලාභී දරුවන්ගේ අධ්‍යාපන කටයුතු සඳහා ආධාර ලබා දීම | 1,000,000.00 |
| 60 | 607(9)10 | සංචාරක ව්‍යාපෘතිය ප්‍රවර්ධනය | 50,000.00 |
| 61 | 607(9)11 | දොරවක පෙර පාසල් ළමා උද්‍යානය නඩත්තු කටයුතු | 200,000.00 |
| 62 | 607(9)12 | මායින්නොළුව උප කාර්යාල භූමියේ ඇති ළිඳ අළුත්වැඩියා කිරීම | 200,000.00 |
| 63 | 607(9)13 | තඹදිය ප්‍රජා ශාලා ගොඩනැගිල්ලේ පුස්තකාලයක් ආරම්භ කිරීම | 200,000.00 |
| 64 | 609(2) | ප්‍රාග්ධන වියදම් | 2,500,000.00 |
| 65 | 609(5) | සභාව සතු ප්‍රජා ශාලා නවීකරණය | 800,000.00 |
| 66 | 609(6) | නගර ශාලාවේ ඉතිරි වැඩ නිම කිරීම | 40,000,000.00 |
| 67 | 609(7) | වාරියගොඩ පුස්තකාලය ඉදිකිරීම | 500,000.00 |
| | | එකතුව | 173,959,428.34 |